සැ. යු. - 2020.11.20 දින අංක 2203 දරන ගැසට් පත්‍රයේ II, III, IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,204 - 2020 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2020.11.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1328 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ. යු.- (i) විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2020 නොවැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා භෞතචිකිත්සක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2020 නොවැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 දෙසැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1327 – B 82081 — 402 (2020/11)

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. ඩී. පී. පෙරේරා සහ ආර්. ටී. ඩබ්ලිව්. ජේ. එම්. ආර්. එන්. පී. එල්. බී. ඩී. විජයරත්න.
ගිණුම් අංක : 0021 5004 4866.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.05.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශ්ෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2018 ජනවාරි 25 දාතම හා අංක 3100 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් හි බදුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොස්වත්තගේ ඩේමියන් ප්‍රසන්න පෙරේරා සහ රන්දුනු තේන්නකෝන් වික්‍රමසිංහ ජයසේකර මුදියන්සේ රාලහාමිලාගේ නෙරන්ජන් ප්‍රියදර්ශන ලොකුබණ්ඩා ඩුල්ලෑව විජේරත්න යන අය බන්ධනදයීන් වශයෙන් හා එකී රන්දුනු තෙන්නකෝන් වික්‍රමසිංහ ජයසේකර මුදියන්සේ රාලහාමිලාගේ නෙරන්ජන් ප්‍රියදර්ශන ලොකුබණ්ඩා ඩුල්ලෑව විජේරත්න යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 3100 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් නම කෝටි හැත්තෑ හත් ලක්ෂ අසූදහස් විසි දෙකයි ශත අටක (රු. 97,780,022.08) මුදලක් 2019 මැයි 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් නමකෝටි හැත්තෑ හත් ලක්ෂ අසූ දහස් විසි දෙකයි ශත අටක (රු. 97,780,022.08) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 3100 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් නම කෝටි දෙලක්ෂ පනස් තුන්දහස් නමසිය අසූ හතරයි ශත විසි තුනක (රු. 90,253,984.23) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 3100 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

උතුරු මැද පළාතේ. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, උතුරු කනාදර කෝරළේ (සුළු කොට්ඨාසය) නුවරගම් පළාත (නැගෙනහිර) ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුල අනුරාධපුර මහ නගර සභා සීමාවන් තුළ 01 අදියර අංක 249 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ අනුරාධපුරය පිහිටි ''ඇළබොඩ කැළේ'' යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද පත්‍ඉරු අංක 81 (අතිරේක අංක 01) හි අංක 02 දරන අවසන් නාගරික සැළසුමේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 342 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FVP 523හි ලොට් 341 සහ 61, නැගෙනහිරට : FVP 523හි ලොට් 61 සහ ලොට් 1071 සහ 818, දකුණට : ලොට් 818, 837 සහ 343 හා බස්නාහිරට : ලොට් 837, 343 සහ 341 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම තුනයි නමයයි හතරයි එකක් (හෙක්ටෙයාර් 0.3941) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක අ. 02 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව D26/105 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 353/3

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. ඩී. පී. පෙරේරා, එස්. එම්. පී. රූපසිංහ, ජේ. එම්. ඩී. ටී. ආර්. සෙල්සියා නොහොත් ජේ. එම්. ඩී. ටී. රාණි සහ එන්. ටී. පී. රූපසිංහ නෙහොත් එන්. රූපසිංහ.
ගිණුම් අංක : 1021 5478 2002.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.05.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශ්ෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජී. කේ. ආලෝකබන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2015 අප්‍රේල් 02 දාතම හා අංක 401 දරන සහ 2016 දෙසැම්බර් 20 දාතම හා අංක 968 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොස්වත්තගේ ඩේමියන් ප්‍රසන්න පෙරේරා, සලූජා මදුවන්ති පෙරේරා රූපසිංහ, ජයමාන්න මොහොට්ටිගේ දෝන තෙරේසා රාණි සෙල්සියා නොහොත් ජයමාන්න මොහොට්ටිගේ තේරේසා රාණි සහ නිව්ටන් තියඩෝර් පෙරේරා රූපසිංහ නොහොත් නිව්ටන් රූපසිංහ යන අයවලුන් බන්ධනදායීන් වශයෙන් හා එකී සලූජා මදුවන්ති පෙරේරා රූපසිංහ සහ නිව්ටන් තියඩෝර් පෙරේරා රූපසිංහ නොහොත් නිව්ටන් රූපසිංහ යන අයවලුන් උකස්කරුවන් වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 401 සහ 968 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ හැටහය දහස් දෙසීය විසි තුනයි ශත හැට පහක (රු. 13,666,223.65) මුදලක් 2019 මැයි 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ හැටහය දහස් දෙසීය විසි තුනයි ශත හැට පහක (රු. 13,666,223.65) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 401 සහ 968 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පනස් ලක්ෂ විසි හතර දහස් තුන්සිය අනූවයි ශත හැට හයක (රු. 5,024,390.66) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් හතලිස් නම ලක්ෂ හතලිස් නම දහස් හයසිය පනස් හතරයි ශත පනස් හතරක (රු. 4,949,654.54) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) හා තවත් රුපියල් විසිහය ලක්ෂ අනූපන් දහස් නමසිය අනූ අටයි ශත තිස් තුනක (රු. 2,695,998.33) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 401 සහ 968 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ මීගමුව මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඒත්තුකාල් අංක 73 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ඒත්තුකාල් ග්‍රාමයේ පිහිටි ''දවටගහවත්ත, බදුල්ලගහකුඹුර නොහොත් කිරිල්ලගහකුඹුර, කහගහවත්ත, කසතමරත්තඩිතෝට්ටම් සහ පුන්නමරතඩිතෝතටම් '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. එම්. ජී. ඩයස් යන අය විසින් සාදන ලද 2007 මැයි 28 දතම හා අංක 4017A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර, නැගෙනහිරට : ඇළ නමුත් ටෝ පාත් ( Tow Path) (වඩා නිවැරදිව), දකුණට : අංක 4017 A දරන එකී පිඹුරේ ලොට් 1B සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 4017 A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව G 128/106 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 353/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඒ. ෆර්ඩවුස් - ගිණුම් අංක : 0093 5000 7250.
ග්ලෝබල් ට්‍රස්ට් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් දැන් හඳුන්වනු ලබන
ග්ලෝබල් ටයර් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0093 1000 1195.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.11.28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි

කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2016 නොවැම්බර් 25 සහ 28 දතම හා අංක 1865 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අන්වර් ෆර්ඩවුස් බන්ධනදයී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එල්. ඩී. වත්සලා යන අය විසින් ලියා සහතික කරන ලද 2018 සැප්තැම්බර් 26 සහ ඔක්තෝබර් 18 දතම හා අංක 736 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 120599 දරන ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචි කිරීමේ නීතිත් යටතේ නිසිලෙස සංස්ථා ගත කොට ඇති සමාගමක් වන ග්ලෝබල් ට්‍රස්ට් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් දූන් හඳුන්වනු ලබන ග්ලෝබල් ටයර් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයී වශයෙන් හා අන්වර් ෆර්ඩවුස් උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 1865 සහ 736 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි පනස් දෙලක්ෂ හැත්තෑ නම දහස් දෙසීය දහතයි ශත විස්සක (රු. 25,279,217.20) මුදලක් 2019 ඔක්තෝබර් 29 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි පනස් දෙලක්ෂ හැත්තෑ නම දහස් දෙසීය දහතයි ශත විස්සක (රු. 25,279,217.20) මුදල ද, 2019 ඔක්තෝබර් 30 දින සිට අංක 1865 සහ 736 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දෙකෝටි තිස්හය ලක්ෂ අනූහය දහස් හයසීයයක (රු. 23,696,600) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) බැගින් වූ පොලිය ද, දන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1865 සහ 736 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසයේ බදුල්ල මහ නගර සභා සීමාවන් තුළ බදුල්ල - නැගෙනහිර 78B දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කෙඳෙළගම පිහිටි ගලබඩ පාර (රිවර් සයිඩ් පාර) වරිපනම් අංක 9B දරන ''කොඩිතුවක්කු කුඹුර '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. පී. ගුණරත්න යන අය විසින් සාදන ලද 2000 පෙබරවාරි 04 දතම හා අංක 929 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ඇති ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 9 A දරන ඉඩම (වඩා නිවැරදිව වත්ත), නැගෙනහිරට : රිවර් සයිඩ් පාර, දකුණට : මෙම පිඹුරේ ලොට් 4 (අඩි 10 පළල පාර) (වඩා නිවැරදිව අඩි 10 පළල පාර) සහ බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 4 (අඩි 10 පළල පාර) සහ මෙම පිඹුරේ ලොට් 01 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම දෙකයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.21) හෝ හෙක්ටයාර් 0.0157ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 929 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව A169/123 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එම්. පී. ගුණරත්න යන අය විසින් සාදන ලද 2000 පෙබරවාරි 04 දතම හා අංක 929 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 04 වශයෙන් ලකුණුකොට ඇති අඩි 10 පළල පාර දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 363

---

## සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. ඩී. පී. පෙරේරා සහ කේ. ආර්. ටී. එන්. පෙරේරා.
ගිණුම් අංක : 0021 5004 4785.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.05.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජී. කේ. ආලෝකබන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2018 මාර්තු 26 දතම හා අංක 1211 දරන සහ 2018 ජුනි 08 දතම හා අංක 1273 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොස්වත්තගේ ඩේමියන් ප්‍රසන්න පෙරේරා සහ කොස්වත්තගේ රීටා තෙරෙස් නතාලියා පෙරේරා යන අය බන්ධනදයින් වශයෙන් හා එකී කොස්වත්තගේ රීටා තෙරෙස් නතාලියා පෙරේරා යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1211 සහ 1273 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් විසිහත් කෝටි අසූ පන්ලක්ෂ පනස්හතර දහස් හයසිය හයයි ශත හැත්තෑ හතරක (රු. 278,554,606.74) මුදලක් 2019 මැයි 02 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් විසිහත් කෝටි අසූ පන්ලක්ෂ පනස්හතර දහස් හයසිය හයයි ශත හැත්තෑ හතරක (රු. 278,554,606.74) මුදල ද, 2019 මැයි 03 දින සිට අංක 1211 සහ 1273 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක (රු. 15,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක (16.5%) හා තවත් රුපියල් විසිතුන් කෝටි එකොළොස් ලක්ෂ අනූඅට දහස් දොළහයි ශත විසි අටක (රු. 231,198,012.28) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate (Quarterly) + Four Per centum (4%) per annum බැගින් වූ පොළිය ද, දන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1211 සහ 1273 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැන්ද කෝරළේ, මිහින්තලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසය තුළ කුරුන්දකුළම අංක 574 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කුරුන්දකුළම ග්‍රාමයේ පිහිටි ඉඩමට බලයලත් මානක තැන එන්. බී. ඒකනායක යන අය විසින් සාදන ලද 2012 මැයි 06 දතම හා අංක 828 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සඳහා වෙන් කිරීම, නැගෙනහිරට : ලොට් 34හි ඉඩම, දකුණට : ලොට් 42හි ඉඩම සහ බස්නාහිරට : පාර සඳහා වෙන් කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 828 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව LDO E12/56 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 353/1

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දිගන ශාඛාව**

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය**

කෝරළේවත්තේ ගෙදර ධම්මික නිශාන්ත සමරකෝන්.

2019 දෙසැම්බර් මස 04 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. උඩුවාවල විසින් ලියා සහතික කරන ලද අංක 5454 හා 2016.11.09 දින දරන බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල් ගෙවීම ණයකරු වශයෙන් කෝරළේවත්තේ ගෙදර ධම්මික නිශාන්ත සමරකෝන් විසින් පැහැර හැර ඇති අතර, ඒ අනුව, එකී බැඳුම්කරය මත ඔබ වෙත ප්‍රදනය කරන ලද නිවාස ණය පහසුකම මත 2019 අගෝස්තු 31 වැනි දිනට රුපියල් මිලියන හයයි පන් ලක්ෂ දහනම දහස් හත්සිය පනස් එකයි ශත අනූවක (රු. 6,519,751.90) මුදලක් දූන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව 2019 සැප්තැම්බර් 01 දින සිට විකුණුම් දිනය දක්වා තවදුරටත් පොළිය ද සමග රු. 6,591,751.90ක එකී මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ එතෙක් ගෙවා ඇති යම් මුදලක් (ඇත්නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 5454 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද සහ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පල්ලෙකැලේ ග්‍රාම නිලධාරී වසම තුළ කෙන්ගල්ලේ පිහිටි බලගොල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. වී. සිරිසුමන විසින් සාදන ලද අංක 8934 (වඩාත් නිවැරදිව 8937) සහ 2009 මැයි 10 දින දරන පිඹුරේ දක්වෙන ලොට් 1බී වශයෙන් ලකුණු කරන ලද බෙදවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : පී පී මහ 2879 දරන පිඹුරේ ලොට් 9 සහ 10 ද, නැගෙනහිරට : එකී 2879 දරන පිඹුරේ ලොට් 11 ද, දකුණට : ලොට් 14 වශයෙන් ලකුණු කරන ලද පාර සහ බස්නාහිරට : ලොට් 1ඒ වශයෙන් ලකුණු කරන ලද එම ඉඩමේම ඉතිරි කොටස ද මායිම් වූ පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30)ක් හෝ හෙක්ටෙයාර් 0.0759ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ එහි ඇති සෑම සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)/ මාණ්ඩලික ලේකම්.

11 - 415

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.